සියලුම හිමිකම් ඇවිරිණි ]
All Rights Reserved ]

Learning Resource Center
R

Econ I
8 Pages

ද මැසනොද් විදුහල, කඳාන
De Mazenod Collage - Kandana

දෙවන වාර පරීක්ෂණය - 2018 අප්‍රේල්
අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ

6 . 04 . 2018

ආර්ථික විද්‍යාව I
Economics I

13 ශ්‍රේණිය

කාලය
පැය 02

උපදෙස්

- 1 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට (1),(2),(3),(4),(5) යන පිළිතුරු වලින් නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන පිළිතුර තෝරා එහි අංකය ප්‍රශ්නය ඉදිරියෙන් ඇති වරහන තුළ යොදන්න.

01. ආර්ථික විද්‍යා විෂයයේ අවධානය යොමු වන්නේ මිනිසා හා සමාජයේ ආර්ථික හැසිරීම් හා සංසිද්ධීන් පැහැදිලි කිරීමටයි. මේ කාර්ය සඳහා සාපේක්ෂ වශයෙන් යොමුවන ප්‍රකාශන දෙකකි.
   1. ගෘහ ආර්ථික විද්‍යා හා කළමණාකරණ ආර්ථික විද්‍යා ප්‍රකාශ
   2. සූක්ෂ්ම ආර්ථික විද්‍යා හා සාර්ව ආර්ථික විද්‍යා ප්‍රකාශ
   3. කෘෂි ආර්ථික විද්‍යා හා කාර්මික ආර්ථික විද්‍යා ප්‍රකාශ
   4. යථාතුරූප ආර්ථික විද්‍යා හා අභිමතානුරූපී ආර්ථික විද්‍යා ප්‍රකාශ
   5. සූක්ෂ්ම ආර්ථික විද්‍යා හා ක්ෂුද්‍ර ආර්ථික විද්‍යා ප්‍රකාශ

(..................)

02. හිඟකම පිළිබඳ ප්‍රශ්නය පැන නගින්නේ
   1. මිනිසුන්ගේ වුවමනා අසීමිත වීම හා සම්පත් ප්‍රමාණය සීමාසහිත වීම නිසාය
   2. ස්වායත්ත හා පරායත්ත විචල්‍යයන් අතර පවතින අනුලෝම සම්බන්ධය නිසාය
   3. ආර්ථික නොවන භාණ්ඩ පමණක් සෑම සමාජයකම පවතින නිසාය
   4. මිනිසුන් තම තම ආදායම ප්‍රශස්තව වියදම් නොකරන නිසාය
   5. සේවා වියුක්ත සම්පත් සෑම සමාජයකම පවතින නිසාය

(..................)

03. පහත සඳහන් ඒවා අතරින් අනාර්ථික භාණ්ඩ පමණක් ඇතුළත් කාණ්ඩය තෝරන්න.
   1. ගංගා, ඇළ දොළ, කලපු , සාගර,වැව්
   2. වර්ෂාව, සුළං , දියවැල් , සූර්ය ලෝකය, ආර්ද්‍රතාව
   3. මහා මාර්ග, දුම්රි මාර්ග, වරාය ,ගුවන් තොටුපල
   4. දිය ඇලි , මුහුදු , ජලාශ, මහද්දීප, තටාක , විල් , ඇල මාර්ග
   5. පාසල් , රෝහල් , ප්‍රජා ශාලා ,ග්‍රාම සංවර්ධන මධ්‍යස්ථාන

(..................)

04. ආවස්ථික පිරිවැය ශූන්‍ය වන අවස්ථාවක් නොවන්නේ,
   1. තොග මිලට භාණ්ඩ පැවතීම
   2. එක් ප්‍රයෝජනයක් ඇති භාණ්ඩයක් පැවතීම
   3. රැකියා විරහිත අයෙකුට රැකියාවක් ලැබීම
   4. තම ආදායමෙන් යතුරු පැදියක් මිලට ගැනීම
   5. පොදුවේ විරැකියාවක් පැවතීම

(..................)

05. කිසියම් සමාජයක පුද්ගලයින් ශ්‍රමයට ලැබෙන වැටුප හා දේපොළ අයිතිය මත ලබන ආදායම් ඔවුන් විසින් ගන්නා ලද පරිභෝජන තීරණ වෙත වැය කරයි නම් මින් වඩාත් පැහැදිලි වන්නේ,
   1. වෙළෙඳපොළ ආර්ථිකයක නිෂ්පාදන තීරණය වන ආකාරයයි
   2. එරට ජනතාවගේ පාරිභෝජන මට්ටම ඉහළ මට්ටමක පවතින බවයි
   3. වෙළෙඳපොළ ආර්ථිකයක ආදායම හා පරිභෝජනය අතර සිදු කරන තේරීමයි
   4. විධානගත ආර්ථිකයක පරිභෝජනය තීරණය වන ආකාරයයි
   5. වෙළෙඳපොළ ආර්ථිකයක් තුළ උපයන ආදායමෙන් වැඩි කොටසක් පරිභෝජනය සඳහා වියදම් කරන බවයි

(..................)


06. කිසියම් රටක නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය මත
1. එක් භාණ්ඩයක නිෂ්පාදනය අඩු නොකොට අනෙක් භාණ්ඩයේ නිෂ්පාදනය වැඩි කළ හැකි වේ
2. ආර්ථිකයේ නිෂ්පාදන අකාර්යක්ෂමතාවයක් පවතී
3. පවත්නා සම්පත් පූර්ණ වශයෙන් උපයෝජනය වී තිබේ
4. තාක්ෂණය වෙනස් වෙමින් පවතී
5. ඵලදායිතාව වැඩිවීමක් පෙන්නුම් කරයි (.................)

07. විශේෂ ප්‍රාගුණ්‍යය වැඩිවීම නිසා ආර්ථිකය තුළ සිදුවිය හැකි ප්‍රතිවිපාකයන් වන්නේ,
1. ඒකක පිරිවැය ඉහළ යාමක්
2. පාරිභෝගික තෘප්තිය ඉහළ යාමක්
3. සාධක ඵලදායිතාව ඉහළ යාමක්
4. මුළු නිෂ්පාදන පිරිවැය ඉහළ යාමක්
5. ආන්තික නිෂ්පාදනය පහළ යාමක් (.................)

08. කිසියම් අඹ නිෂ්පාදකයෙකු අඹ ගෙඩි 100 ක් නිෂ්පාදනය කළ අතර අඹ ගෙඩියක් රුපියල් 10 ක් බැගින් අලෙවි කරන ලදී. මෙම භාණ්ඩයේ මිල ඉල්ලුම් නම්‍යතාවය -2.0 ක් වූ අතර ඊලඟ අඹ වාරයේදී අඹ මිල 20% කින් පහළ ගියේ නම් දෙවන අඹ වාරයේදී ගොවියා ලැබූ අයහාරය
1. රුපියල් 100 කින් වැඩිවෙයි
2. රුපියල් 520 කින් ඉහළ යයි
3. රුපියල් 180 කින් පහළ යයි
4. රුපියල් 120 කින් ඉහළ යයි
5. රුපියල් 480 කින් ඉහළ යයි (.................)

09. කිසියම් භාණ්ඩයක මිල රුපියල් 50 ක සිට 62.50 දක්වා ඉහළ ගිය අතර වෙනත් භාණ්ඩයක ඉල්ලුම් ප්‍රමාණය ඒකක 40 ක සිට ඒකක 20 ක් දක්වා අඩු වී තිබේ නම් මෙම භාණ්ඩයට පදාල ආර්ථික විද්‍යාත්මක සංකල්පය වන්නේ,
1. නම්‍යතාව 2.0 ක් වන අතර ආදේශ භාණ්ඩ වේ
2. නම්‍යතාව 0.5 ක් වන අතර අනුපූරක භාණ්ඩ වේ
3. නම්‍යතාව 2 ක් වන අතර අනුපූරක භාණ්ඩ වේ
4. නම්‍යතාව 0.5 ක් වන අතර ආදේශ භාණ්ඩ වේ
5. නම්‍යතාව 2.5 ක් වන අතර අනුපූරක භාණ්ඩ වේ (.................)

10. ඉහත රූප සටහකට අනුව S හා $S_1$ සැපයුම් වක්‍ර වල A ලක්ෂයේ සැපයුම් නම්‍යතාව වන්නේ පිළිවෙලින්





1. ESP = 2.5 සහ 0.62
2. ESP = 0.8 සහ 1.5
3. ESP = 1.0 සහ 0.8
4. ESP = 0.62 සහ 2.5
5. ESP = 1.5 සහ 0.8 (.................)

11. QD = 600 – 10P QS = 100 + 10P

ඉහත වෙළෙඳපොළට අදාල භාණ්ඩය සඳහා රජය විසින් අවම මිලක් ලෙස රු. 40 ක් නියම කරන ලදී. අධි සැපයුම් ප්‍රමාණය රජය මිලදී නොගන්නේ නම් භාණ්ඩයේ වෙළෙඳපොළ මිල කොපමණද වේද?
1. රු. 40 ක් වේ
2. රු. 10 ක් වේ
3. රු. 20 ක් වේ
4. රු. 25 ක් වේ
5. රු. 15 ක් වේ (.................)

Learning Resource Center
R
De Mazenod College
Kandana
6.04.2018
ආර්ථික විද්‍යාව
13

12. කිසියම් භාණ්ඩයක් සඳහා වන සමතුලිත වෙළෙඳපොළක් පහත දක්වේ.




මෙම භාණ්ඩයේ ඒකක 20 ක් අලෙවි කිරීමෙන් නිෂ්පාදකයා අපේක්ෂා කරන අවම ආදායම කොපමණද?

1. රු.80  2. රු.180  3. රු.120  4. රු.40  5. රු.160

(....................)

13. කිසියම් කාලච්ඡේදයක් තුළ කිසියම් භාණ්ඩයක් සඳහා වෙළෙඳපොළ ඉල්ලුම් හා සැපයුම් ලේඛන පහත දක්වේ.

| P | QD | QS |
|---|---|---|
| 80 | 500 | 900 |
| 70 | 600 | 800 |
| 60 | 700 | 700 |
| 50 | 800 | 600 |

මෙම භාණ්ඩයේ ඒකකයක් මත රු.10 ක් බද්දක් රජය විසින් නිෂ්පාදකයාට පනවන ලදී. බද්දෙන් පසුව රු.70 දී අධි සැපයුම කොපමණ වේද?

1.200 කි  2.-200 කි  3. 100 කි  4. -100 කි  5. 300 කි


(....................)

14. එක්තරා භාණ්ඩයක වෙළෙඳපොළ ඉල්ලම් ශ්‍රිතය $Qd = 20 - 2P$ ද අධි ඉල්ලුම් ශ්‍රිතය $ED = 30 - 6P$ වේ නම් වෙළෙඳපොළ සමතුලිකයේ දී නිෂ්පාදන අතිරික්තය වන්නේ,

1.) 25  2.) 22.50  3.) 12.50  4.) 75.00  5.) 25.50

(....................)

15. එක්තරා භාණ්ඩයක් සම්බන්ධයෙන් ඉල්ලුම් හා සැපයුම් වක්‍ර රූප සටහනක් පහත දක්වේ.





සමතුලිත ප්‍රමාණය Q සිට $Q_1$ දක්වා පහළ යාම සඳහා බලපෑ හේතු ඇතුළත් පිළිතුර වන්නේ,

1. නිෂ්පාදන සහනාධාරයක් සහ පාරිභෝගික බද්දක්
2. පිරිවැය ඉහළ යාමක් හා අනුපූරක මිල අඩු වීමක්
3. තාක්ෂණ දියුණුවීමක් හා පාරිභෝගික ආදායම අඩු වීමක්
4. නිෂ්පාදන බද්දක් හා ආදේශක භාණ්ඩ මිල පහළ යාමක්
5. අනුපූරක මිල වැඩි වීමක් හා පාරිභෝගික රුචිය අඩුවීමක්

(....................)

16. පහත රූප සටහනෙන් දක්වෙන ආයතනය සම්බන්ධයෙන් එකග විය හැකි ප්‍රකාශ තෝරන්න




1. ආයතනයේ ලාභ උපරිම වන්නේ $E_1$ ලක්ෂයකට අදාළ නිමැවුම් මට්ටමේදීය
2. E ලක්ෂයට අදාළ නිමැවුම් මට්ටමේදී ආයතනය ආර්ථික ලාභයක් උපයයි
3. E ලක්ෂට අදාළ නිමැවුම මට්ටමේදී ආයතනය ආර්ථික අලාභයක් උපයයි
4. ආයතනයේ කෙටිකාලීන සැපයුම් වක්‍රය E ලක්ෂයේ සිට ඉහළට බෑවුම් වන ආන්තික පිරිවැය වක්‍රය වේ
5. ආයතනයේ අවම සැපයුම් මිල P වේ (..................)

17. පූර්ණ තරගකාරී ආයතනයක් සතියකට භාණ්ඩ ඒකක 200 ක් ඒකකයක් රු.250 බැගින් අලෙවි කරයි. එම ආයතනයේ පිරිවැය පහත පරිදි වේ.

| | |
|---|---|
| මුළු ස්ථාවර පිරිවැය | 20000 |
| මුළු විචල්‍ය පිරිවැය | 60000 |
| ආන්තික පිරිවැය | 200 |

කෙටි කාලයකදී ලාභ උපරිම කිරීමට හෝ අලාභ අවම කර ගැනීමට හෝ මෙම ආයතනය කුමක් කළ යුතුද ?

1. නිෂ්පාදනය මුළුමනින්ම අත්හිටුවීම
2. නිමැවුම් ප්‍රසාරණය කිරීම
3. නිමැවුම සංකෝචනය කිරීම
4. මිල ඉහළ නැංවීම
5. වර්තමාන මට්ටමේ නිමැවුම් පවත්වාගැනීම (..................)

18. පූර්ණ තරගකාරී නිෂ්පාදන ආයතනයක් සතුව පූර්ණ නම්‍ය ඉල්ලුම් වක්‍රයක් පවතී . යන්නෙන් අදහස් කරනුයේ,

1. එම ආයතනයට පවත්නා මිල යටතේ අපරිමිත ප්‍රමාණයක් සැබවින්ම අලෙවි කළ හැකි බවය
2. ආයතනයේ නිමැවුම වැඩි කරන විට ආන්තික පිරිවැය නොවෙනස්ව පවතින බවය
3. මිල ඉහළ නැංවීමෙන් ආයතනයට තම මුළු අයභාරය ඉහළ නංවා ගත හැකි බවය
4. නිෂ්පාදනය කරනු ලබන ප්‍රමාණය කොපමණ වුවද ආයතනයේ මුළු අයභාරය ස්ථාවරව පවතින බවය
5. ආයතනය නිපදවන කවර නිමැවුම් මට්ටමකදී වුවද භාණ්ඩයේ මිල නොවෙනස්ව පවතින බවය (..................)

19. ප්‍රාමාණික ලාභ ලෙස හඳුන්වන්නේ,

1. වර්ෂ කිහිපයක් මුළුල්ලේ නිෂ්පාදන ආයතනයක් උපයන සාමාන්‍ය ලාභ ප්‍රමාණයයි
2. වර්ෂ කිහිපයක් මුළුල්ලේ කර්මාන්තයක් උපයන සාමාන්‍ය ලාභයයි
3. නිෂ්පාදන සම්පත් පවත්නා භාවිතයෙහි රඳවා තබා ගැනීමට අවශ්‍ය ලාභ ප්‍රමාණයයි
4. නිෂ්පාදන ආයතනයක් සමතුලිත මට්ටමේ තබා ගැනීමට අවශ්‍ය කරන ලාභ ප්‍රමාණයයි
5. සාමාන්‍ය අයභාරය ආන්තික අයභාරය සමාන වන අවස්ථාවේ උපයන ලාභයයි (..................)

20. කිසියම් වර්ෂයේදී වෙළඳ මිල යටතේ ගණනය කරන ලද දළ ජාතික නිෂ්පාදිතය දළ දේශීය නිෂ්පාදිතයේ වටිනාකමට වඩා අඩු විය හැක්කේ,

1. ශුද්ධ වක්‍ර බදු සෘණ අගයක් ගැනීම
2. ශුද්ධ විදේශ සාධක ආදායම සෘණ අගයක් ගැනීම
3. ශුද්ධ අපනයනය සෘණ අගයක් ගැනීම
4. විදේශ සම්පත් පරතරය සෘණ අගයක් ගැනීම
5. ශුද්ධ වක්‍ර බදු ධන අගයක් අගයක් ගැනීම (..................)

6 . 04 . 2018
ආර්ථික විද්‍යාව
13

Learning Resource Center
R
De Mazenod College

21. යම් වර්ෂයකදී රටක ජනතාව ජාතික ආදායමට වඩා වියදම් කරනු ලබයි නම් එම තත්වය පිළිඹිබු කරන දර්ශකය කුමක්ද?
   1. රාජ්‍ය වියදම් ඉහළ යාම
   2. විදේශ ආයෝජනය ආදායම් පහළ වැටීම
   3. ශුද්ධ අපනයන සෘණ අගයක් ගැනීම
   4. ආදායම් ප්‍රමාණය සංකෝචනය වීම
   5. ශුද්ධ විදේශ සංක්‍රාම සෘණ අගයක් ගැනීම (..................)

22. වියදම් ප්‍රවේශය යටතේ ඇතුළත් වීම නිසා දළ දේශීය නිෂ්පාදිතියේ වටිනාකම අධිතක්සේරු වීමට බලපෑ හැකි සාධකය කුමක්ද?
   1. ස්ථාවර ප්‍රාග්ධන වියදම්
   2. පාරිභෝජනය මත කරන වියදම්
   3. දෙවන වරට අලෙවි වන භාණ්ඩ මිලට ගැනීම මත කරන වියදම්
   4. අවසාන භාණ්ඩ මත කරන වියදම්
   5. තොග වෙනස් වීම් (..................)

23. පහත සඳහන් ආදායම් ශීර්ෂ වලින් ජාතික ආදායමට ඇතුළත් නොකරන ආදායම් ශීර්ෂ වන්නේ,
   1. සමාගම් වල නොබෙදූ ලාභ
   2. ගොවීන්ගේ ශුද්ධ ඉපැයීම
   3. කුටුම්භ වල ජේෂ්ඨ පුරවැසියන්ට රජයෙන් හිමිවන දීමනා
   4. සංගීත ශිල්පියකුට ගී තනු නිර්මාණය කිරීම වෙනුවෙන් ලැබෙන ආදායම්
   5. මූල්‍ය ප්‍රාග්ධනය සැපයූ අයට ව්‍යාපාරිකයින් විසින් පොලී ගෙවීම (..................)

24. ව්‍යාපාර චක්‍රයක පතුලේ සිට මුදුනත දක්වා ගමන් කළ විට දකිය හැකි තත්වයකි
   1. සැබෑ නිමැවුම වැඩි වේ සේවා නියුක්තිය වැඩි වී උද්ධමනය ඇතිවේ
   2. සැබෑ නිමැවුම වැඩි වේ සේවා නියුක්තිය අඩු වී උද්ධමනය අඩු වේ
   3. සැබෑ නිමැවුම වැඩි වේ සේවා නියුක්තිය වැඩි වී උද්ධමනය අඩු වේ
   4. විභව නිමැවුම වැඩි වේ සේවා නියුක්තිය අඩු වී උද්ධමනය ඇති වේ
   5. විභව නිමැවුම වැඩි වේ සැබෑ නිමැවුම අඩු වී උද්ධමනය අඩු වේ (..................)


25. ජාතික ගිණුම් කරණයේදී වැටුප් + පොලී + ලාභ + දේපොල ආදායම් + ගෙවුම් ශේෂයේ ප්‍රාථමික ආදායම් ශේෂය එකතු කළ විට ලැබෙන ජාතික සංකල්පය වන්නේ
   1. දළ ජාතික ආදායම
   2. ශුද්ධ දේශීය නිෂ්පාදිතය
   3. ශුද්ධ දේශීය ආදායම
   4. දළ ජාතික නිෂ්පාදිතය
   5. ජාතික ආදායම (..................)

26. කිසියම් රටක නාමික දළ දේශීය නිෂ්පාදිතය රුපියල් 1600 ක් මූර්ත දළ දේශීය නිෂ්පාදිතය රු. මිලියන 1200 ක්ද වේ නම් එරට දළ දේශීය නිෂ්පාදිතයේ අවධානමක දර්ශකයේ අගය මිලියන කොපමණද?

1) 1.75    2) 133.3    3) 75    4) 1.66    5) 220 (..................)

27. සාර්ව ආර්ථික විග්‍රහ තුළ සමතුලිත නිමැවුම් මට්ටම නිවැරදිව අර්ථ කථනය වන්නේ කෙසේද?
   1. පවත්නා අගයේ සිට ඉහළට හා පහළට වෙනස්වීමකින් තොරව පවත්වා ගත හැකි කුමන හෝ නිමැවුම් මට්ටමකි.
   2. ඌණ සේවා නියුක්ති මට්ටමට වඩා වැඩි ස්ථාවරව පවත්වා ගත හැකි නිමැවුම් මට්ටමකි.
   3. නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය මත තීරණය වන උච්චාවචනයකින් තොර නිමැවුම් හෝ ආදායම් මට්ටමකි.
   4. පවත්නා සේවා නියුක්ති මට්ටම අවම උච්චාවචන මට්ටමක පවත්වා ගැනීමයි.
   5. පූර්ණ සේවා නියුක්ති මට්ටමට හෝ ඊට ඉහළ සමතුලිත නිමැවුම් මට්ටමකි. (..................)

28. කල්පිත සරල ආර්ථිකයක පරිභෝජනයේ සිදුවූ වෙනස හේතුවෙන් පරිභෝජන වක්‍රය වෙනස් වූ ආකාරය පහත පරිදි වේ.



මෙම රූප සටහනට අනුව එකග විය හැකි ප්‍රකාශය වන්නේ,

| | ජාතික ආදායම | ආන්තික පරිභෝජන නැමියාව | සාමාන්‍ය ඉතුරුම් නැමියාව |
|---|---|---|---|
| 1 | වැඩිවේ | අඩුවේ | වෙනසක් නොවේ |
| 2 | අඩුවේ | වැඩිවේ | අඩුවේ |
| 3 | වැඩිවේ | වෙනසක් නොවේ | අඩුවේ |
| 4 | වෙනසක් නොවේ | වෙනසක් නොවේ | වැඩිවේ |
| 5 | අඩුවේ | වැඩිවේ | අඩුවේ |

(..................)

29. පාරිභෝජන ශ්‍රිතය $C = 100 + 0.8yd$ වන සංවෘත ආර්ථිකයක රජයේ මිලදී ගැනීම රු. බිලියන 30 කින් ඉහළ නැංවූ අතර ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සපයා ගැනීම සඳහා ස්වාධීන බදු රු. බිලියන 35 කින් ඉහළ නැංවන ලදී . මෙහි ප්‍රතිඵලයක් ලෙස,

1. සතුලිත ජාතික ආදායම රු. බිලියන 100 කින් ඉහළ යයි.
2. සමාහාර ඉල්ලුම රු. බිලියන 30 කින් පහළ යයි.
3. සමතුලිත ජාතික ආදායම රු. බිලියන 100 කින් පහළ යයි.
4. සමාහාර ඉල්ලුම රු. බිලියන 10 කින් ඉහළ යයි.
5. සමාහාර ඉල්ලුම වෙත කිසිදු බලපෑමක් නොවේ.

(..................)

30. සරල ආර්ථිකයක පරිභෝජන ශ්‍රිතය $C= 100+0.8yd$ හා $y= 1000$ වන්නේ නම් ආර්ථිකයේ ආයෝජන මට්ටම වන්නේ,

1.) 630 2.) 2500 3.) 370 4.) 3000 5.) 600 (..................)

31. සරල ආර්ථිකයක ආන්තික පරිභෝජන නැමියාව 0.6 කි . ආයෝජනය රු. බිලියන 150 කින් වැඩි කළ විට සමතුලිත ආදායම ප්‍රසාරණය වන්නේ,

1. රු. මිලියන 375 කිනි .
2. රු. මිලියන 15 කිනි
3. රු. මිලියන 60 කිනි
4. රු. මිලියන 9 කිනි
5. රු. මිලියන 68 කිනි

(..................)

32. පහත සංරචක තුලින් $M_2b$ මුදල් සමස්තයේ සංරචකයන් නොවන්නේ ඒන් කුමක්ද?

1. බලපත්‍රලාභි විශේෂ බැංකු වල පෞද්ගලික තැන්පතු
2. එතෙර බැංකු වල නේවාසිකයන්ගේ තැන්පතු
3. මහජනයා නමින් ඇති වාණිජ බැංකු ගිණුම් වල ඉතුරුම් තැන්පතු
4. මහජනයා සතු ජංගම ශේෂ
5. මහජනයා සතු ව්‍යවහාර මුදල්

(..................)

33. පුද්ගලයෙකු රුපියල් 4800 ක මුදලක් වාණිජ බැංකුවක ජංගම ගිණුමක තැන්පත් කරන ලදී . සංචිත අනුපාතය 20% ක් නම් මෙම තැන්පතුව මත ණය මැවීම සම්පූර්ණ කළ විට පද්ධතියට මැවිය හැකි උපරිම ණය ප්‍රමාණය කොපමණද?

1. රු.22200 2. රු.18200 3. රු.19200 4. රු.24000 5. රු.16200

(..................)

34. වාණිජ බැංකුවක ලාභදායීත්වය සීමාකාරී වීම කෙරේ බලපාන සාධකය හඳුනා ගන්න.

1. අධි සංචිත නොපැවතීම
2. ප්‍රාථමික සංචිත අඩුවීම
3. පොලී අනුපාතික අඩු වීම
4. ද්විතීය සංචිත අඩු වීම
5. ද්‍රවශීලතාව ඉහළමට්ටමක පැවතීම

(..................)

35. නිෂ්පාදනයේ බාහිර පිරිවැය යටතට ඔබ ඇතුළත් කරන පිරිවැය වන්නේ,

1. නිෂ්පාදනයේ පෞද්ගලික ගිණුම් වල අතුළත් වන පිරිවැය
2. නිෂ්පාදනයක් හේතු කොටගෙන බාහිර අයට ලැබෙන වාසියයි.
3. නිෂ්පාදකයාට දැරීමට සිදුනොවන බාහිර සමාජය වෙත පැවරෙන පිරිවැයයි.
4. නිෂ්පාදනය වෙනුවෙන් බාහිර පාර්ශවයෙන් මිලට ගන්නා නිෂ්පාදන සාධක පිරිවැයයි.
5. නිෂ්පාදයින්ට පාලනය කළ නොහැකි නියගය වැනි බාහිර පිරිවැයයි.

(..................)

Learning Resource Center
R
De Mazenod College
Kandana
6-04-2018
අ - කි.

36. රාජ්‍ය අයවැයේ වර්තන ගිණුමේ හිඟය මගින් අදහස් වන්නේ,
1. වර්තන වියදම් පියවා ගැනීමට රාජ්‍ය ඉතුරුම් පවතින බවයි
2. රාජ්‍ය ඉතුරුම් ධන අගයක් ගන්නා බවයි
3. රාජ්‍ය ව්‍යාපාර පෞද්ගලික අංශයට විකිණිය යුතු බවයි
4. රාජ්‍යයේ ප්‍රාග්ධන වියදම් අඩු කිරීමට සිදු වන බවයි
5. රජයේ පවත්නා පාරිපූර්ණ කටයුතු පවත්වා ගැනීමට ණය ගත යුතු බවයි. (.................)

37. රාජ්‍ය අය වැය හිඟයක් මගින් උද්ධමනාත්මක ප්‍රතිවිපාක ඇති නොවන ණය මාර්ගය හඳුනාගන්න.
1. මහ බැංකුවෙන් ණය ගැනීම
2. රක්ෂණ ආයතන මගින් ණය ගැනීම
3. සම්පත් බැංකුවෙන් ණය ගැනීම
4. විදෙශ වලින් ණය ගැනීම
5. වාණිජ බැංකු මගින් ණය ගැනීම (.................)

38. පොදු සම්පත් යනුවෙන් අදහස් කරන්නේ පහත දක්වෙන කුමන භාණ්ඩ වර්ගයද?
1. පරිභෝජනයේ තරඟ කාරිත්වයක් ඇති පරිභෝජනය සීමා කළ නොහැකි භාණ්ඩ වේ
2. පරිභෝජනයේ තරඟයක් නැති පරිභෝජනය සීමා කළහැකි භාණ්ඩ වේ
3. සාමූහික පරිභෝජනය කළ හැකි භාණ්ඩයකි
4. පරිභෝජනයේ තරඟකාරිත්වයක් නැති ලෝක ප්‍රජාවටම පරිභෝජනය කළ හැකි භාණ්ඩයකි
5. පරිභෝජනයේ ධන බාහිරතා ඇති සමාජ ප්‍රතිලාභ වැඩි භාණ්ඩයකි (.................)

39. අතිරේක පුද්ගලයෙකු සඳහා ශුද්ධ පොදු භාණ්ඩයක් සැපයීමේදී සමාජ ආන්තික පිරිවැය
1. අනන්ත වේ
2. දුර්මට සිදුවේ
3. සෘණඅගයක් ගනී
4. ශුන්‍ය අගයක් ගනී
5. ධන අගයක් ගනී (.................)

40. පරිභෝජනයේ "පෞද්ගලික ප්‍රතිලාභ" වලට අමතරව විශාල වශයෙන් "බාහිර ප්‍රතිලාභ" බිහිකරන භාණ්ඩයකි.
1. ජාතික ආරක්ෂාව
2. පෞද්ගලික මෝටර් රථයක්
3. මහා මාර්ග
4. අධ්‍යාපන සේවා
5. රූපවාහිනී නාලිකා (.................)

41. මිලක් අයකර පරිභෝජනය සීමා කිරීමට හැකි හා පරිභෝජනයේදී තරඟකාරිත්වයක් පවතී නම්, එම භාණ්ඩය
1. පෞද්ගලික භාණ්ඩයක්ම විය යුතුය
2. පෞද්ගලික හෝ පොදු භාණ්ඩයක් විය යුතුය
3. සුබ සාධන භාණ්ඩයක් විය යුතුය
4. පොදු භාණ්ඩයක් හෝ සුබ සාධන භාණ්ඩයක් විය යුතුය
5. පෞද්ගලික හෝ සුබ සාධන භාණ්ඩයක් විය යුතුය (.................)

42. මිලක් අයකර පරිභෝජනය සීමා කළ නොහැකි වුවද පරිභෝජනයේදී තරඟකාරිත්වයක් පැවතිය හැක්කේ මින් කුමකද?
1. පොදු උද්‍යාන
2. පොදු තණ බිම්
3. මුහුදු වෙරළ
4. ගුවන් විදුලි නාලිකා
5. පුස්තකාල (.................)

43. අයවැය ලේඛනයෙන් කිසියම් අමාත්‍යංශයකට යම් වර්ෂයක් සඳහා වෙන් කළ මුදල් ප්‍රමාණවත් නොවන විටදී අතිරේක මුදල් ලබා ගැනීම පිණිස අදාල විෂය භාර ඇමතිතුමා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනුයේ
1. අතුරු සම්මත ගිණුම යි
2. අතුරු අය වැය ලේඛනයයි
3. විසර්ජන පනතයි
4. පරිපූරක ඇස්තමේන්තුවයි
5. විමධ්‍යගත අයවැයයි (.................)

44. රාජ්‍ය අය වැය හිඟය පූර්ණය සඳහා දේශීය සම්පත් වැඩි වශයෙන් යොදා ගැනීම නිසා පෞද්ගලික අංශයේ ඵලදායී ආයෝජන කෙරෙහි ඇතිකරන අහිතකර බලපෑම් හඳුන්වන්නේ,
1. ආදායම් ප්‍රතිවිපාකය
2. ආදේශ ප්‍රතිවිපාකය
3. තෙරපුම් ප්‍රතිවිපාකය
4. මූල්‍ය ප්‍රතිවිපාකය
5. පොළී ප්‍රතිවිපාකය (.................)

45. ශුද්ධ පොදු භාණ්ඩයක දැකිය හැකි ලක්ෂණයක් නොවන්නේ,
1. තරගකාරී නොවන පරිභෝජනය
2. පරිභෝජනයේදී භාණ්ඩයක් කොටස් කර බෙදාහල නොහැකිවීම
3. අතිරේක පුද්ගලයෙකුට සැපයීමේදී ආන්තික පිරිවැයක් පැවතීම
4. ප්‍රතිලාභ ලබන්නන් සීමා කළ නොහැකි වීම
5. සාමූහික පරිභෝජනය

(.................)

46. ජපානය හා කොරියාව ජංගම දුරකතන හා මෝටර් රථ නිපදවනවායි සිතන්න. මෙම භාණ්ඩ නිපදවීමේදී අවශ්‍ය ශ්‍රම ඒකක පහත දැක්වේ.

| භාණ්ඩය | ජපානය | කොරියාව |
|---|---|---|
| ජංගම දුරකථන | 10 | 12 |
| මෝටර්රථ | 120 | 150 |

රටවල් දෙක සඳහා ජංගම දුරකථන නිපදවීමේ ආවස්ථික පිරිවැය මෝටර් රථ වලින් ගණනය කරන්න

| | ජපානය | කොරියාව |
|---|---|---|
| 1 | 0.8 | 0.04 |
| 2 | 0.08 | 0.08 |
| 3 | 0.008 | 0.04 |
| 4 | 0.2 | 0.62 |
| 5 | 0.3 | 0.25 |

(.................)

47. ඉහත වගුව අනුව ජංගම දුරකථන නිපදවීමේ සාපේක්ෂ වාසිය ඇති රට වන්නේ
1. ජපානයයි
2. කොරියාවයි
3. රටවල් දෙකටමය
4. කිසිදු රටකට නොවේ
5. නිරපේක්ෂ වාසිය ජපානයට ඇත

(.................)

48. එංගලන්තයේ හා පෘතුගාලයේ ශ්‍රම ඒකකයක් සඳහා ලැබෙන නිමැවුම් ප්‍රමාණ පහත වගුවේ දැක්වේ.

| භාණ්ඩය | එංගලන්තය | පෘතුගාලය |
|---|---|---|
| රෙදි | 20 | 24 |
| වයින් | 2 | 12 |

ඉහත දත්ත පදනම් කරගනිමින් අපට නිගමනය කළ හැක්කේ,
1. රෙදි හා වයින් නිෂ්පාදනයෙන් පෘතුගාලයට සාපේක්ෂ වාසි පවතින බවය
2. රෙදි හා වයින් නිෂ්පාදනයෙන් එංගලන්තයට සාපේක්ෂ වාසි පවතින බවය
3. රෙදි පෘතුගාලයටත් වයින් එංගලන්තයටත් ඇති බවය
4. රෙදි එංගලන්තයටත් වයින් පෘතුගාලයටත් ඇති බවය
5. එංගලන්තයට රෙදි හා වයින් නිෂ්පාදනයෙන් නිරපේක්ෂ වාසියක් පවතින බවය

(.................)

49. විනිමය අනුපාතිකයේ පහළ වැටීමක් බොහෝ දුරට තුඩු දෙනුයේ,
1. අපනයන මිල ඉහළ යාමටය
2. ආනයන මිල පහළ යාමටය
3. අපනයන සඳහා ඉල්ලුම වැඩි වීමටය
4. ආනයන සඳහා ඉල්ලුම වැඩි වීමය
5. පොළී අනුපාතිකය ඉහළ යාමටය

(.................)

50. පහත සඳහන් දෑ අතුරෙන් කවරක් ශ්‍රී ලංකාවේ අදෘශ්‍ය අපනයන ගණයට ඇතුළත් වේ ද?
1. ජපන් ජාතික ව්‍යාපාරිකයෙකු ශ්‍රී ලංකාවට පැමිණීම සඳහා ශ්‍රී ලංකන් ගුවන් සේවයෙන් ටිකට් පතක් මිලදී ගැනීම
2. ජපන් ජාතික සංචාරකයෙකු සිඟප්පූරුවේදී කරන වියදම
3. ශ්‍රී ලාංකික ගෘහ සේවිකාවක් සවුදි අරාබියේදී කරන ලබන වියදම
4. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ලබා ගත් ණය මුදලක් ශ්‍රී ලංකා රජය විසින් ආපසු ගෙවනු ලැබීම
5. ශ්‍රී ලංකාවේ ඇඟළුම් කම්හලක් විසින් උපයන ලද ලාභ දකුණු කොරියාවේ මවු සමාගම වෙත ප්‍රේෂණය කිරීම

(.................)

21 S II

5 Pages - Econ II

ද මැසිනොද් විදුහල - කඳාන

De Mazenod College - Kandana

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 13 ශ්‍රේණිය

2018 අප්‍රේල් පරීක්ෂණය

6.04.2018

# ආර්ථික විද්‍යාව
# Economics

කාලය පැය 03

**'අ' කොටසින් ප්‍රශ්න 02 ක් ද, 'ආ' කොටසින් ප්‍රශ්න 02 ක් ද ඇතුළත් වන සේ ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.**

## 'අ' උප කොටස

(1) i. මිනිස් වුවමනා, හිඟකම සහ ආවස්ථික පිරිවැය අතර ඇති සම්බන්ධතාවයපැහැදිලි කරන්න. (ලකුණු 04)

ii. රටක නිෂ්පාදන හැකියාව කිනම් කරුණු මඟින් තීරණය වේද? (ලකුණු 04)

iii. නිෂ්පාදනය සඳහා යොදා ගන්නා සම්පත් නොගැළපීම නිසා බිහිවන ආවස්ථික පිරිවැය හැසිරීම යෝග්‍ය රූපසටහන් ඇසුරින් පැහැදිලි තරන්න. (ලකුණු 04)

iv. රටක වර්තමාන පරිභෝජනය වැඩි හෝ අඩුවීම එරට අනාගත ආර්ථික වෘද්ධිය කෙරෙහි බලපාන ආකාරය යෝග්‍ය රූපසටහන් යොදා ගනිමින් පැහැදිලි කරන්න. (ලකුණු 04)

v. නිෂ්පාදන හැකියා වක්‍රයේ ප්‍රධාන උපකල්පනයන් බිඳවැටීම නිසා ඇතිවිය හැකි තත්ත්වයන් යෝග්‍ය රූපසටහන් භාවිතා කරමින් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(2) i. නිදහස් වෙළෙඳපොළ ආර්ථිකයක ආණ්ඩුවේ කාර්යභාරය කෙබඳු වේද? (ලකුණු 04)

ii. පෞද්ගලික පිරිවැය සහ සමාජ පිරිවැය අතර වෙනස පැහැදිලි කර, මෙම පිරිවැය වර්ග දෙක අතර වෙනසක් ඇතිවීම වෙළෙඳපොළ ආර්ථිකයේ කාර්යක්ෂමතාවය කෙරෙහි කෙසේ බලපානු ලබයි ද? (ලකුණු 04)

iii. සුබසාධන භාණ්ඩ යනු මොනවාද? වෙළෙඳපොළ විසින් ඒවා ප්‍රමාණවත් පරිදි සැපයුම් නොකරන්නේ මන්ද? (ලකුණු 04)

iv. ව්‍යාපතියේ සාධාරණත්වයක් ඇති කිරීම සඳහා මිශ්‍ර ආර්ථිකයක රජයේ මැදිහත් වීම පැහැදිලි කරන්න. (ලකුණු 04)

v. මධ්‍යගත සැලසුම්කරණයේ පවතින ප්‍රධාන අවාසි මොනවා ද? (ලකුණු 04)

Learning Resource Centre R De Mazenod College Kandana

(3) i. සලකා බලන භාණ්ඩයේ වෙළෙඳපොළ ඉල්ලුම් වක්‍රය වමේ සිට දකුණට පහළට බෑවුම් වන්නේ මන් ද? (ලකුණු 04)

ii. භාණ්ඩයක වෙළඳපොළ සැපයුම් වක්‍රය වමට විතැන් වීමට තුඩුදෙන සාධක මොනාවා ද? (ලකුණු 04)

iii. ආණ්ඩුව විසින් කිසියම් භාණ්ඩයක් සඳහා උපරිම මිලක් නියම කළවිට ශුද්ධ ශුභ සාධනයේ හටගන්නා වෙනස යෝග්‍ය රූපසටහනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 04)

iv. ආණ්ඩුවේ මැදිහත්වීම නිසා කිසියම් භාණ්ඩයක් නිපදවීම සඳහා ඕනෑවට වඩා වැඩියෙන් සම්පත් වෙන් කෙරෙන තත්ත්වයක් යෝග්‍ය රූපසටහන් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 04)

v. ඉල්ලුමේ ආදායම් නම්‍යතාවය යනු කුමක් ද? එහි ප්‍රායෝගික වැදගත්කම කවරේ ද? (ලකුණු 04)

---

(4) i. කෙටිකාලීන පිරිවැය හා දිගුකාලීන පිරිවැය අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 04)

ii. ආන්තික ආදායම හා සාමාන්‍ය ආදායම අතර වෙනස දක්වා පූර්ණ තරඟකාරී ආයතනයක සාමාන්‍ය හා ආන්තික ආදායමේ හැසිරීම පැහැදිලි කරන්න. (ලකුණු 04)

iii. පූර්ණ තරඟකාරී ආයතන මිල ගනුවෙකු ලෙස ක්‍රියාකරන්නේ මන් ද? (ලකුණු 04)

iv. ගණකාධිකරණ ලාභ සහ ආර්ථික ලාභ අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 04)

v. දිගු කාලයේ දී ආර්ථික ලාභ ශුන්‍ය වන වෙළෙඳපොළ ආකෘතීන් මොනවා ද? එම ආකෘතිවල දැකිය හැකි පොදු ලක්ෂණ මොනවා ද? (ලකුණු 04)

---

(5) i. දළ දේශීය නිෂ්පාදිතය සහ දළ ජාතික ආදායම අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 04)

ii. ඔබගේම කල්පිත සංඛ්‍යා යොදා ගනිමින් නිමැවුම්, ආදායම් හා වියදම් ප්‍රවේශයන් යටතේ වෙළෙඳපොළ මිලට දළ දේශීය නිෂ්පාදිතය ඇස්තමේන්තු කරන්න. (ලකුණු 05)

iii. වැය කළහැකි දළ ජාතික ආදායම යනු කුමක් ද? වැය කළහැකි දළ ජාතික ආදායම ලබා ගැනීම සඳහා ඔබ දේශීය වියදමට කවර ගැළපීම් සිදුකරනු ලබන්නේ ද? (ලකුණු 04)

iv. ඒක පුද්ගල දළ ජාතික ආදායම යනු කුමක් ද? එය ඇස්තමේන්තු කරන්නේ කෙසේ ද? මෑත වර්ෂවල ශ්‍රී ලංකාවේ ඒක පුද්ගල දළ ජාතික ආදායම කොපමණ ද? (ලකුණු 04)

6.04.2018
Grade - 13
ආර්ථික විද්‍යා

## 'ආ' උප කොටස

(6) i. ආන්තික පරිභෝජන නැඹියාවේත්, ආන්තික ඉතුරුම් නැඹියාවේත් ඓක්‍ය එකට සමාන වන්නේ මන් ද? (ලකුණු 04)

ii. විවෘත ආර්ථිකයක සාර්ව ආර්ථික සමතුලිතය දෙයාකාරයකට ඉදිරිපත් කළ හැකි ය. යෝග්‍ය ප්‍රස්ථාර සටහන් ඇසුරින් එම ආකාර දෙක දක්වන්න. (ලකුණු 04)

iii. විදේශ කටයුතු නොමැති ආර්ථිකයක් පිළිබඳ දත්ත පහත දක්වේ.

- පරිභෝජනය $C = 120 + 0.6y_d$ (සංඛ්‍යා රුපියල් මිලියන වලිනි)
- බදු $T = -150 + \frac{1}{6}y$
- ආයොජනය $I = 250$
- රජයේ මිලදී ගැනීම $G = 400$
- සංක්‍රාම $Tr = 50$

Learning Resource Center
R
De Mazenod College
Kandana

(අ) සමතුලිත නිමැවුම් මට්ටම ගණනය කරන්න. (ලකුණු 04)

(ආ) ආණ්ඩුවේ ඉතුරුම් ඇස්තමේන්තු කරන්න. (ලකුණු 04)

(ඇ) පෞද්ගලික ආයෝජනය මිලියන 170 කින් වැඩි වුවහොත් සමතුලිතයේ දී පෞද්ගලික පරිභෝජන වියදම කොපමණ ද? (ලකුණු 04)

---

(7) i. ද්‍රවශීලතාවය සහ ද්‍රවශීලතාවරණය අතර වෙනස පහදන්න. (ලකුණු 04)

ii. මුදල් පදනම සහ මුදල් සැපයුම අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 04)

iii. පුළුල් මුදල් සැපයුම (M 4) ට අයත් ආසන්න මුදල් සංරචක කවරේ ද? (ලකුණු 04)

iv. දේශීය උද්ධමනය රටක නාමික හා මූර්ත විනිමය අනුපාතිකයන් කෙරෙහි ඇති කරන බලපෑම කෙබඳු වේද? (ලකුණු 04)

v. ශ්‍රී ලංකාවේ උද්ධමන මිනුමක් වශයෙන් ජාතික පාරිභෝගික මිල දර්ශකය හඳුන්වන්න. (ලකුණු 04)

(8) i. ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතිය තුළ දැකිය හැකි ප්‍රධාන අංශ මොනවා ද? (ලකුණු 04)

ii. මූල්‍ය ප්‍රතිපත්තිය යනු කුමක් ද? ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මූල්‍ය ප්‍රතිපත්තිය මෙහෙයවීමේ දී යොදා ගන්නා ප්‍රධාන ඉලක්කයන් මොනවා ද? (ලකුණු 04)

iii. තරඟකාරී වාණිජ බැංකු පද්ධතියක් මිලියන 700 ක සංචිත ද, මිලියන 1300 ක ණය දීම් දී මිලියන 500 ක සුරැකුම්පත් ද සහිතව 20% ක ව්‍යවස්ථාපිත සංචිත අනුපාතයකට යටත් ව කටයුතු කරයි. ආර්ථිකයේ මුදල් සැපයුම $(M_1)$ මිලියන 4000 ක් ද, ජනතාව වෙතැති ව්‍යවහාරික මුදල් මිලියන 1500 ක ද වේ.

(අ) අධි සංචිත ණය දීම මඟින් ගැලපූ විට,

(a) බැංකු පද්ධතියේ වත්කම් හා වගකීම් ව්‍යුහය සකසන්න. (ලකුණු 04)

(b) නව මුදල් සැපයුම කොපමණ වේ ද? (ලකුණු 02)

(ආ) මහජනතාව තමන් සතු මි. 300 ක් වාණිජ බැංකුවල තැන්පත් කළෙ නම්, අවශ්‍ය ගැළපුම් කළ විට,

(a) මුළු තැන්පතු ප්‍රමාණය (ලකුණු 02)

(b) මුදල් සැපයුමේ නව අගය (ලකුණු 02)

(c) අළුත් වතකම් හා වගකීම් ව්‍යුහය සොයන්න. (ලකුණු 02)

---

(9) i. හොඳ බදු ක්‍රමයක තිබිය යුතු ලක්ෂණ මොනවා ද? (ලකුණු 04)

ii. ඍජු බදු හා වක්‍ර බදු අතර වෙනසෙහි පදනම කවරේ ද? (ලකුණු 04)

iii. මෑත වර්ෂවල ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආදායමේ සංයුතිය පැහැදිලි කරන්න. (ලකුණු 04)

iv. "ශ්‍රී ලංකාවේ නොපියවූ රාජ්‍ය ණය දළ දේශීය නිෂ්පාදිතයට සාපේක්ෂව ඉහළ මට්ටමක පවතී"

(අ) 2013 - 2016 කාලච්ඡේදය තුළ ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණය දළ දේශීය නිෂ්පාදිතයට සාපේක්ෂව කොපමණ වී ද? (ලකුණු 04)

(ආ) රාජ්‍ය ණය ඉහළ මට්ටමක පැවතීමේ ආර්ථික ප්‍රතිවිපාක කවරේ ද? (ලකුණු 04)

6.04.2018
Grade - 13
ආර්ථික විද්‍යාව

(10) (i) බංගලාදේශය සහ චීනය රෙදි සහ ආහාර නිෂ්පාදනය කරයි. ඊට අදාළ තොරතුරු පහත වගුවේ දක්වේ.

නිමැවුම් ඒකකයක් සඳහා ශ්‍රම පිරිවැය (පැය)

| භාණ්ඩය / රට | රෙදි | ආහාර |
|---|---|---|
| බංගලාදේශය | 8 | 2 |
| චීනය | 8 | 4 |

Learning Resource Center
R
De Mazenod College
Kandana

(අ) රෙදි සහ ආහාර සඳහා නිරපේක්ෂ වාසි ඇති රටවල් මොනවා ද?
(ලකුණු 02)

(ආ) එක් එක් රටෙහි එක් එක් භාණ්ඩයේ ආස්ථික පිරිවැය සොයන්න.
(ලකුණු 02)

(ඇ) රෙදි සහ ආහාර සඳහා සාපේක්ෂ වාසි ඇති රටවල් මොනවා ද?
(ලකුණු 02)

(ඉ) කුමන රටක්, කුමන භාණ්ඩයක් විශේෂීකරණය කළ යුතු ද?
(ලකුණු 02)

(ii) ජාත්‍යන්තර වෙළඳාමට පවතින තීරු බදු බාධක සහ තීරු බදු නොවන බාධක මොනවා ද?
(ලකුණු 04)

(iii) අන්තර් ජාතික වෙළෙඳම කෙරෙහි ලෝක වෙළෙඳ සංවිධානයේ අරමුණු සහ කාර්යභාරය පැහැදිලි කරන්න.
(ලකුණු 04)